සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
சுகாதார மற்றும் சுதேச வைத்திய சேவைகள் அமைச்சு
Ministry of Health and Indigenous Medical Services

# කොවිඩ්-19 වසංගත තත්වයතුල මැතිවරණ පැවැත්වීම සම්බන්ධ මාර්ගෝපදේශය

# கொவிட்-19 நோய் பரவுதலுக்கு மத்தியில் தேர்தல் நடாத்துவதற்கான சுகாதார வழிகாட்டல்கள்

# Health guidelines for conducting the Elections amidst the COVID-19 outbreak




2020 ජූනි
ஆணி 2020
June 2020

Designed by Dr. Lakshman Gamlath

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

# කොවිඩ් -19 රෝග ව්‍යාප්තිය මධ්‍යයේ මැතිවරණ පැවැත්වීම සඳහා

# සෞඛ්‍ය මාර්ගෝපදේශය

2020 ජූනි 01

# පටුන


| පරිච්ඡේදය | මාතෘකාව | පිටු අංකය |
|---|---|---|
| 01 | පොදු කරුණු | 03 |
| 02 | විශේෂිත අවස්ථා | 04 |
| | 2.1 ප්‍රචාරක රැස්වීම් | 04 |
| | 2.2 ප්‍රචාරණ පත්‍රිකා නිවෙස් වලට බෙදා දීම | 05 |
| | 2.3 මැතිවරණ කාර්යාල | 05 |
| | 2.4 පුහුණු සැසි | 05 |
| | 2.5 දිස්ත්‍රික් තේරීම් භාර කාර්යාල වලදී ඡන්ද පත්‍රිකා පරික්ෂා කිරීම සහ (ගොනු) මිටි බැඳීම | 06 |
| | 2.6 තැපැල් ඡන්දය | 06 |
| | 2.7 තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම | 06 |
| | 2.8 ඡන්ද පත්‍රිකා පරිහරණය කිරීම | 07 |
| | 2.9 ඡන්ද මධ්‍යස්ථානය | 07 |
| | 2.10 නිරෝධායන මධ්‍යස්ථාන වල මැතිවරණය පැවැත්වීම | 09 |
| | 2.11 ගණන් කිරීමේ මධ්‍යස්ථාන වලදී ඡන්ද පෙට්ටි බාර ගැනීම | 09 |
| | 2.12 ගණන් කිරීමේ මධ්‍යස්ථානයෙදී පිළිපැදිය යුතු ආචාර විධි | 10 |
| | 2.13 ප්‍රතිඵල නිකුත් කිරීමේ මධ්‍යස්ථානය | 11 |
| | 2.14 කාර්ය මණ්ඩලය සහ භාණ්ඩ ප්‍රවාහනය | 11 |
| | 2.15 ආපන ශාලා සහ ආහාර ගැනීමේ ස්ථාන | 11 |
| 03 | පොලිස් නිලධාරීන් සඳහා විශේෂිත උපදෙස් | 12 |
| 04 | විෂබිජහරණය | 12 |
| | 4.1 මතුපිට පෘෂ්ඨ විෂබිජහරණය සඳහා උපදෙස් | 12 |
| | 4.2 ගොඩනැගිලි පරිශ්‍ර විෂබිජහරණය සඳහා උපදෙස් | 13 |
| 05 | කසල කළමනාකරණය | 13 |
| 06 | මැතිවරණයෙන් පසු | 13 |
| 07 | සෞඛ්‍ය පරිපාලන ව්‍යුහය | 14 |
| | ඇමුණුම් 1. විෂබිජහරණ ද්‍රාවණ පිළියෙළ කරන ආකාරය | 18 |

# 1. පොදු කරුණු

මෙම මාර්ගෝපදේශයේ පරමාර්ථය වනුයේ ඕනෑම මැතිවරණයකදී සාමාන්‍ය ජනතාව, මැතිවරණ කාර්ය මණ්ඩලය සහ මැතිවරණයට සම්බන්ධ අනෙකුත් පුද්ගලයන් කොවිඩ්-19 රෝගයෙන් ආරක්ෂා කිරීම සඳහා අනුගමනය කළ යුතු විශේෂ සෞඛ්‍ය ක්‍රියාමාර්ග විස්තර කිරීම වේ.

රෝගය බිඳිති මගින් සම්ප්‍රේෂණය වේ. කැස්ස, කතා කිරීමේදී, කිවිසුම් යාමේදී හෝ ආසාදිත පුද්ගලයින්ගේ හුස්ම පිට කිරීමේදී පවා බිඳිති නිපදවිය හැකිය. මෙම බිඳිති වලට මීටරයක පමණ දුරක් ගමන් කල හැක.

රෝග සම්ප්‍රේෂණය ක්‍රම දෙකකින් සිදුවිය හැක.

- **ඍජු-** රෝගී පුද්ගලයකු සමග ඍජු සබඳතාවයක් පැවැත්වීම මගින් (සිප වැළඳ ගැනීම, අතට අත දීම) පුද්ගලයකුගෙන් පුද්ගලයකුට රෝගය බෝවිය හැක. වෛරසය නාසය, ඇස් හෝ මුඛ මාර්ගයෙන් ශරීරයට ඇතුල් විය හැක.
- **ඍජු නොවන-** අසාදිත පුද්ගලයකු කහින විට, කිවිසුම් යැවීමේදී හෝ ප්‍රශ්වාස කරන විට, නිපදවන අසාදිත කෙල බිඳිති අවට ඇති පෘෂ්ඨ සහ මේස, දුරකථන, පරිගණක වැනි දේ මත පතිත විය හැක. නිරෝගී පුද්ගලයකු අසාදිත කෙල බිඳිති සහිත පෘෂ්ඨයක් හෝ උපකරණ ඇල්ලීමෙන් පසු, තම ඇස් , නාසය හෝ මුඛය ඇල්ලීමෙන් වෛරසය ශරීරයට ඇතුල් විය හැක.

**රෝග සම්ප්‍රේෂණය වැළක්වීම සඳහා පහත සඳහන් තත්වයන් පාලනය කිරීම වැදගත් ය.**

### 1.1. මැතිවරණයට පෙර දිස්ත්‍රික්ක අතර ජනතාවගේ ගමනාගමනය

මැතිවරණ දිනයට පෙර මිනිසුන් තම සේවා ස්ථානවල සිට තම ගම්බිම් කරා ගමන් කරයි. මෙමගින් රෝගය සම්ප්‍රේෂණය වීමේ අවදානමක් ඇති කරයි. එබැවින් පොලීසිය, ත්‍රිවිධ හමුදාව සහ සේවකයින් විශාල සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති රාජ්‍ය ආයතනයන්හි , තැපැල් ඡන්දය දීර්ඝ කිරීම හෝ කල්තියා ඡන්දය ප්‍රකාශ කිරීමේ පහසුකම් සැපයිය හැකි නම්, පුද්ගලයින් ගැවීම වැළැක්විය හැකි අතර රෝග සම්ප්‍රේෂණය අවම කිරීමට එය බෙහෙවින් ඉවහල් වේ. විශාල සේවක සංඛ්‍යාවක් සහිත පෞද්ගලික අංශයේ ආයතන සඳහා ද මෙම පහසුකම ලබා දීම පිළිබඳ කොමිසමට සලකා බැලිය හැකිය. මෙම කල්තියා ඡන්ද විමසීම / තැපැල් ඡන්දය දීර්ඝ කිරීම නිර්දේශ කරනුයේ එමගින් මැතිවරණය පැවැත්වීමේ දිනය ප්‍රමාද නොවන්නේ නම් පමණි.

### 1.2. කාර්ය මණ්ඩලය සේවයට වාර්තා කිරීම

කිසියම් ස්ථානයක් (පුහුණු, ඡන්ද මධ්‍යස්ථාන, ගණන් කිරීමේ මධ්‍යස්ථාන ආදිය) භාරව සිටින නිලධාරියා විසින් පහත සඳහන් කවර හෝ නිලධාරියෙකු රාජකාරි / පුහුණු සඳහා කැඳවීම හෝ ඔවුන්ගේ පැමිණීම සිදු නොවන බවට සහතික විය යුතුය.

- කොවිඩ්-19 සඳහා නිරෝධායනය වෙමින් සිටින පුද්ගලයින්
- නිරෝධායනය කාලය අවසන් කර දින 14ක් සම්පූර්ණ කර නොමැති අය

**1.3. සියලුම අවස්ථා වලදී පහත සඳහන් මූලික ක්‍රියාපටිපාටියන් අනුගමනය කල යුතුය**

සියලුදෙනා මෙම රෝගයෙන් ආරක්ෂා වීම සඳහා පහත දක්වා ඇති මූලික ක්‍රියාමාර්ග අනුගමනය කිරීම වැදගත් වේ.

- මුඛ ආවරණයක් පැළඳීම
- පුද්ගලයන් අතර මීටරයක දුරස්තභාවයක් පවත්වා ගැනීම.
- හැකි සෑම විටම සබන් යොදා අත් සේදීම හෝ විෂබිජහරණය කිරීම.
- කැස්ස සහ කිවිසුම් යාමේදී වැලමිටෙන් හෝ ටිෂූ කඩදාසියකින් ආවරණය කිරීම.
- මුහුණ, නාසය, මුඛය සහ ඇස් අතින් නොඇල්ලීම

# 2. විශේෂිත අවස්ථා

**2.1 ප්‍රචාරක රැස්වීම්**

2.1.1 කොවිඩ්-19 රෝගයට නිරාවරණය වීම වළක්වා ගැනීම සඳහා පුද්ගල රැස්වීම් අවම කර, මැතිවරණ ප්‍රචාරණය සඳහා මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය විශේෂයෙන් රූපවාහිනී භාවිතා කිරීම නිර්දේශ කරනු ලැබේ.

2.1.2 ප්‍රචාරක රැස්වීම් පවත්වන්නේ නම්, සහභාගී වන්නන්ගේ සංඛ්‍යාව උපරිම පුද්ගලයින් 100 කට සීමා කල යුතු වේ.

2.1.3 ප්‍රචාරක රැලි නිර්දේශ නොකරයි.

2.1.4 රැස්වීම ආරම්භ කිරීමට අවම වශයෙන් දින 3 කට පෙර සංවිධායක විසින් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දිය යුතුය.

2.1.5 සියලුම සහභාගිවන්නන් සෑම විටම මුඛ ආවරණ පැළඳිය යුතු අතර වාඩි වී සිටියදී එකිනෙකා සමඟ මීටරයක දුරක් පවත්වා ගැනීමට හැකි වන පරිදි ආසන සකස් කල යුතුය.

2.1.6 එකිනෙකා අතර අවශ්‍ය දුර ප්‍රමාණය පවත්වා ගැනීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහිත ස්ථානයක් තෝරා ගත යුතුය. එම ස්ථානයේ වාතාශ්‍රය නිසිලෙස පවත්වා ගත යුතුය.

2.1.7 කථිකයන් ද එකිනෙකා සමඟ මීටරයක දුරක් පවත්වා ගත යුතුය.

2.1.8 රැස්වීම්වලදී අත් පත්‍රිකා බෙදා හැරීම අනුමත කරනු නො ලැබේ.

2.1.9 එක් කථිකයකු භාවිතයෙන් පසු මයික්‍රෝෆෝනය විෂබීජහරණය කල යුතුය (විෂබීජ නාශක ක්‍රියා පටිපාටිය සඳහා කරුණාකර 04 වන පරිච්ඡේදය බලන්න).

2.1.10 කොවිඩ්-19 රෝගයට නිරාවරණය වීම අවම කිරීම සඳහා රැස්වීමේ කාලය පැය 3 කට සීමා කල යුතුය.

2.1.11 රැස්වීම සංවිධානය කරන පුද්ගලයා / සංවිධානය විසින් සහභාගී වූ සියලුම පුද්ගලයින්ගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක තබා ගත යුතුය.

**2.2 ප්‍රචාරණ පත්‍රිකා නිවෙස් වලට බෙදා දීම**

2.2.1 වරකට ගමන් කරන ප්‍රචාරක කණ්ඩායමේ සාමාජිකයන් සංඛ්‍යාව 03 ක් දක්වා සීමා කිරීම නිර්දේශ කරනු ලැබේ.

2.2.2 උණ හෝ ශ්වසන රෝග ලක්ෂණ ඇති ඕනෑම පුද්ගලයෙකු මේ සඳහා සහභාගී නොවිය යුතුය.

2.2.3 සහභාගී වන සෑම පුද්ගලයකුම මුඛ ආවරණ පැළඳිය යුතු අතර සෑම විටම එකිනෙකා සමඟ මීටරයක දුරක් පවත්වා ගත යුතුය.

2.2.4 පත්‍රිකා බෙදා දෙන පුද්ගලයා එක් එක් වාරයක ට පෙර සහ පසුව දෑත් විෂබීජහරණය කල යුතුය.

2.2.5 ප්‍රචාරක කණ්ඩායම් සාමාජිකයින් ගෙවල් තුලට ඇතුළුවීම නිර්දේශ නොකරයි.

**2.3 මැතිවරණ කාර්යාල**

සෑම දෙනාම ඉහත 1.2 සහ 1.3 වගන්තිවල සඳහන් උපදෙස් සහ පහත සඳහන් උපදෙස් අනුගමනය කල යුතුය

2.3.1 අපේක්ෂකයින් විසින් පුද්ගලයින් එක් රැස්වීම අඩු කිරීම සඳහා මැතිවරණ කාර්යාල ගණන සීමා කල යුතුය.

2.3.2 අත්‍යාවශ්‍ය වැඩකටයුතු සඳහා පමණක් විවෘත කල යුතුය.

2.3.3 ඕනෑම වේලාවක කාර්යාලයේ සිටින පුද්ගලයින්ගේ සංඛ්‍යාව අවම මට්ටමකට සීමා කල යුතුය

**2.4 පුහුණු සැසි**

2.4.1 පුහුණු සැසිය පැවැත්වෙන ස්ථානයට පිවිසෙන ස්ථානයේ සබන් යොදා දෑත් සේදීම / දෑත් විෂබීජහරණය සඳහා පහසුකම් සැපයිය යුතුය.

2.4.2 පාදය මඟින් ක්‍රියාත්මක කල හැකි ජල කරාමයක් සහිත බේසමක් නිර්දේශ කරනු ලැබේ.

2.4.3 අවම නිලධාරීන් සංඛ්‍යාවක් පමණක් සහභාගී කරවා ගැනීමට වග බලා ගත යුතුයි.

2.4.4 සහභාගිවන්නන් අතර මීටරයක දුරක් පවත්වා ගැනීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහිත, හොඳින් වාතාශ්‍රය සහිත සුදුසු ස්ථානයක් තෝරාගෙන නිසිලෙස සැකසිය යුතුය.

2.4.5 සියලුම පුහුණුකරුවන්, සහභාගිවන්නන් සහ අනෙකුත් සියලුම කාර්ය මණ්ඩලය මුඛ ආවරණ පැළඳිය යුතුය. හැකිතාක් දුරට මුද්‍රිත ද්‍රව්‍ය/ ලිපිලේඛන බෙදා හැරීම අවම කිරීම සහ අවශ්‍ය සටහන් / ලිපිලේඛන පුහුණුවට පෙර මුද්‍රිත නොවන ඉලෙක්ට්‍රොනික මාධ්‍ය හරහා බෙදා හැරීම සිදුකල යුතුය.

2.4.6 පුහුණු සැසි සිදුවන අතරතුර ආහාරපාන ලබා දීමෙන් වැළකී සිටිය යුතුය.

2.4.7 හොඳින් වාතාශ්‍රය ඇති විවෘත ස්ථානයක ආහාරපාන පිළිගැන්වීම වඩාත් සුදුසු වන අතර එහිදී සැම විටම එකිනෙකා අතර අවම මීටරයක දුරස්ථ භාවයක් පවත්වා ගත යුතුය.

2.4.8 සබන් සහිත දෑත් සේදීමේ පහසුකම් ආහාර පිළිගන්වන ස්ථානයේ තිබිය යුතුය.

**2.5 දිස්ත්‍රික් තේරීම් භාර කාර්යාලවල ඡන්ද පත්‍රිකා පරීක්ෂා කිරීම හා මිටි (ගොනු) සෑදීම.**

2.5.1 නිලධාරීන් අතර සැම විටම අවම වශයෙන් මීටරයක දුරක් පවත්වා පවත්වා ගත හැකි වන පරිදි මෙම ක්‍රියාකාරකම් සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහිත ස්ථානයක් තෝරා ගත යුතුය.

2.5.2 නිලධාරීන් වට රවුම් මේසවලින් තොරව එක් පෙළකට සිටින සේ ස්ථාන ගත කල යුතුය.

2.5.3 සියලුම නිලධාරීන් මුඛ ආවරණ පැළඳිය යුතුය.

2.5.4 නිලධාරීන් අතර ලිපි ලේඛන හුවමාරුව හැකි තරම් සීමා කල යුතුය.

2.5.5 සේවකයින් අතර ද්‍රව්‍ය හුවමාරු වීම අවම කිරීම සඳහා ප්‍රමාණවත් පරිභෝජන ද්‍රව්‍ය (උදා: කඩදාසි, මැලියම්, ස්ටේප්ලර් යන්ත්‍ර, ලේඛන මිටි බැඳීමේ ද්‍රව්‍ය ආදිය) සැපයිය යුතුය. සැම පුද්ගලයෙකුටම තමාගේම ලිපි ලේඛන ද්‍රව්‍ය හා පරිභෝජන ද්‍රව්‍ය ලබා දිය යුතුය.

2.5.6 සැම සැසියකටම පසු හොඳින් සබන් යොදා දෑත් සේදිය යුතුය.

**2.6 තැපැල් ඡන්ද**

සහතික කිරීමේ නිලධාරීන්ට ඡන්ද පත්‍රිකා තැපැල් කිරීමේ දී 2.5 වන කොටසේ ක්‍රියා පටිපාටි අනුගමනය කල යුතුය.

**2.7 තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම**

2.7.1 අදාළ පනත් සංශෝධනය කිරීම අවශ්‍ය නොවන්නේ නම්, මැතිවරණ සමයේදී කොවිඩ්-19 පාලන ක්‍රියාකාරකම් අධීක්ෂණය කරන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා කටයුතු සම්පාදනය කල යුතුය.

2.7.2 හැකි නම් සියලුම සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා තැපැල් ඡන්දය ලබා දීම සලකා බලන්න.

2.7.3 ඡන්දය ප්‍රකාශ කරන ස්ථානය පුද්ගලයින් අතරේ මීටරයක භෞතික දුරස්ථ භාවය රැකගත හැකිවන පරිදී ප්‍රමාණවත් ඉඩ පහසුකම් ඇති ස්ථානයක් (උදා: ශාලාවක් ) බවට ආයතන ප්‍රධානියා/ඒ සඳහා පත්කල නිලධාරියා වගබලා ගත යුතුය.

2.7.4 දේශපාලන පක්ෂ වල නියෝජනය හැකිතාක් අවම කරන්න.

2.7.5 ශ්වසන පද්ධතිය ආශ්‍රිත රෝග ඇතිව හෝ නොමැතිව උණ ඇති ඡන්ද දායකයන් ඇතොත් ඔවුන් ඡන්දය ප්‍රකාශ කල යුත්තේ එම ඡන්ද වාරයේ අවසාන ඡන්ද දායකයන් ලෙස බව සියලුම ඡන්ද දායකයින් වෙත දැන්විය යුතුය.

2.7.6 අවම වශයෙන් එකිනෙකා අතර මීටරයක්වත් දුරින් පෝලිම් ගැසෙන ලෙස ඡන්ද දායකයන්ගෙන් ඉල්ලා සිටින යුතු අතර, තදබදය අවම කිරීම සඳහා ඔවුන් කණ්ඩායම් වශයෙන් කැඳවීමට කටයුතු කල යුතුය.

2.7.7 සියලුම නිලධාරීන් සහ ඡන්ද දායකයින් මුඛ ආවරණ පැළඳිය යුතුය.

2.7.8 ඡන්දය ලබා දෙන ස්ථානයේ සිටින ඡන්ද දායකයන්, නිලධාරීන් සහ පරිශ්‍රය තුළ සිටින වෙනත් පුද්ගලයින්, ඔවුන් අතර මීටරයක දුරක් පවත්වා ගත යුතුය.

2.7.9 සියලුම ඡන්ද දායකයන් ඡන්දය දෙන ස්ථානයට පැමිණීමට පෙර දෑත් සේදීම හෝ විෂබීජහරණය කල යුතුය.

2.7.10 ඡන්ද දායකයාගේ අනන්‍යතාවය හැඳුනුම් පත ස්පර්ශ නොකර තහවුරු කල යුතු අතර එසේ ස්පර්ශ කිරීමට සිදු වුවහොත් එම නිලධාරියා වහාම තම දෑත් විෂබීජහරණය කල යුතුය.

2.7.11 ඡන්ද දායකයන්ට ඡන්දය ලකුණු කිරීමට තමාගේම පෑන හෝ පැන්සල භාවිතා කිරීමට උනන්දු කල යුතුය.

2.7.12 ඡන්දය ලකුණු කරන කුටිය සෑම පැයකට වරක්ම විෂබීජහරණය කල යුතුය (කරුණාකර 3.2 කොටස බලන්න).

2.7.13 සියලුම ඡන්ද දායකයින් ඡන්ද කුටියෙන් පිට වීමෙන් පසු දෑත් සබන් යොදා සෝදා ගැනීම හෝ විෂබීජහරණය කල යුතුය.

2.7.14 ශ්වසන පද්ධතිය ආශ්‍රිත රෝග ඇතිව හෝ නොමැතිව උණ ඇති ඡන්ද දායකයෝ ඇතොත් ඔවුන් ඡන්දය ප්‍රකාශ කල යුත්තේ එම ඡන්ද වාරයේ අවසාන ඡන්ද දායකයන් ලෙස වේ. එම ඡන්ද දායකයා/දායකයන් තම ඡන්දය / ඡන්ද ප්‍රකාශ කල පසු,

- එම ඡන්ද දායකයාට /දායකයන්ට මැදිහත් වූ සියලුම නිලධාරීන් වහාම අත් වැසුම් ගලවා සබන් යොදා ඉතා හොඳින් දෑත් සේදිය යුතුය.
- සියලුම ගෘහ භාණ්ඩ සහ වෙනත් භාණ්ඩ 3.2 කොටසේ දැක්වෙන පරිදි විෂබීජහරණය කල යුතුය.

2.7.15 තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීම ආරම්භ කිරීමට පෙර ඉහත සියලුම උපදෙස් ඡන්ද දායකයන්ට සන්නිවේදනය කල යුතු අතර ඡන්දය පැවැත්වෙන ස්ථානයේ ඒවා ප්‍රදර්ශනය කල යුතුය.

2.7.16 තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමේ සමස්ත ක්‍රියාවලිය පුරාම සෞඛ්‍ය ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම සඳහා වගකිවයුතු නිලධාරියෙකු පත් කල යුතුය.

**2.8 ඡන්ද පත්‍රිකා පරිහරණය කිරීම**

දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී කාර්යාලයේ ඡන්ද පත්‍රිකා පරිහරණය කරන සියලුම නිලධාරීන් ඉහත 2.5 කොටසේ ඇති උපදෙස් අනුගමනය කල යුතුය.


**2.9 ඡන්ද මධ්‍යස්ථාන**

2.9.1 ඡන්ද දායකයින් එක් දොරටුවකින් පැමිණ වෙනත් දොරටුවකින් පිටව යාමට හැකි වන පරිදි ඡන්ද මධ්‍යස්ථානය සකස් කර ගන්න.

2.9.2 ඡන්ද මධ්‍යස්ථානයක් සඳහා පත් කරන ඡන්ද පොල නියෝජිතයින් අවම කර ගත යුතුය.

2.9.3 ඇතුළත හා පිටත පෝලිම් සඳහා පොළොවේ මීටර් එකක පරතර ලකුණු කල යුතුය.

2.9.4 ඡන්ද දායකයින් සහ ඡන්ද පොල නිලධාරීන් අතර පාරදෘශ්‍ය ආරක්ෂිත තිරයක් යොදන්න (මේ සඳහා ඝනකම් පොලිතීන් භාවිතා කල හැක). එම තිරයේ පහළින් සකසා ගත් හිඩැසක් තුලින් අවශ්‍ය රාජකාරි කටයුතු  කර ගත හැකි පරිදි සකස් කල යුතුය.




2.9.5 ඡන්ද පොල නිලධාරීන් හා ඡන්ද දායකයින් අතර තබා ගත හැකි උපරිම දුරස්ථභාවය තබා ගන්න.

2.9.6 ඡන්ද දායකයින්ගේ පෝලිමට අවම වශයෙන් මීටරයක් දුරින් ඇතින් සහ නියෝජිතයින් අතර අවම වශයෙන් මීටරයක පරතරයක් සිටින ලෙස ඡන්ද පොල නියෝජිතයින්ගේ ස්ථාන සැකසිය යුතුය.

2.9.7 ඡන්ද පොල නිලධාරීන්ට හෝ වෙනත් ඡන්දදායකයින්ට වඩා සමීප නොවන පරිදි ඡන්ද දායකයින්ගේ පෝලිම් සකස් කල යුතුය.

2.9.8 ඡන්ද මධ්‍යස්ථානයේ පිවිසුම අසල ඡන්ද දායකයන් සඳහා අත් සේදීමේ පහසුකම් සැලසිය යුතු අතර සෑම ඡන්ද දායකයෙකුම ඡන්ද මධ්‍යස්ථානයට පිවිසීමට පෙර අත් සබන් යොදා සේදීම හෝ විෂබීජහරණය කිරීම සිදු කල යුතු අතර සහ මුඛ ආවරණයක් පැළඳීම කල යුතුය.

2.9.9 සියලුම ඡන්ද පොල නිලධාරීන් ඡන්ද මධ්‍යස්ථානයට පිවිසීමට පෙර මුඛ ආවරණ පැළඳීම සහ සබන් යොදා අත් සේදීම අනිවාර්යයෙන් කල යුතුයි.

2.9.10 ඡන්ද පොල නිලධාරීන්, ඡන්ද දායකයින්ගේ හැඳුනුම්පත් හෝ ඡන්ද කාඩ්පත් ඇල්ලීම නොකල යුතු අතර, ඡන්ද දායකයට ඇතින් සිට එය ප්‍රදර්ශනය කරන මෙන් ඉල්ලා සිටිය

යුතුය. එසේ ස්පර්ශ කිරීමට සිදු වුවහොත් එම නිලධාරියා වහාම තම දැත් විෂබීජහරණය කල යුතුය.

2.9.11 ඇඟිලි වර්ණ ගැන්වීම සිදු කරයි නම්, වම් අත මිට මොලවා එහි කුඩා ඇඟිල්ල අත මේසයේ නොගෑවෙන පරිදි දික් කරන ලෙස ඡන්ද දායකයාගෙන් ඉල්ලා සිටිය යුතුය. කපු පුළුන් කූරකින් (Cotton bud) ඇඟිල්ලේ තීන්ත ආලේප කර, ඉන්පසු එය සංවෘත කසල බඳුනකට දැමිය යුතුය. විකල්පයක් ලෙස තීන්ත බින්දුවක් ඇඟිලි තුඩ මත තැබිය හැකිය.

2.9.12 ඡන්ද පෙට්ටිය සහ ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා භාවිතා කරන පෑන සෑම පැයකට වරක්ම විෂබීජහරණය කිරීම සිදු කල යුතුය.

2.9.13 කෝදුවක් මගින් ඡන්ද පත්‍රිකාව ඡන්ද පෙට්ටිය තුලට තල්ලු කිරීම සඳහා වෙනම සේවකයෙකු යෙදවිය යුතුය. එම කෝදුව හෝ එම සේවකයා වෙනස් වන්නේ නම් භාවිතයට පෙර කෝදුව විෂබීජහරණය කල යුතුය.

2.9.14 අත් පිසදැමීම සඳහා සියලුම අත් සේදීමේ ස්ථාන සඳහා ටිෂූ කඩදාසි ලබා දිය යුතුය.

2.9.15 පාවිච්චි කරන ලද ටිෂූ කඩදාසි ඉවතලීම සඳහා ප්‍රමාණවත් කසල බඳුන් සංඛ්‍යාවක් (බඳුන තුලට පොලිතින් බෑගයක් දමා) ලබා දිය යුතුය.

2.9.16 ඡන්ද විමසීම අවසන් වූ පසු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් මධ්‍යස්ථානය විෂබීජහරණය කල යුතුය.

## 2.10 නිරෝධායන මධ්‍යස්ථානවල මැතිවරණය පැවැත්වීම

මැතිවරණය පැවැත්වීමේ ක්‍රියාපටිපාටිය පහත සඳහන් අතිරේක කරුණුද ඇතුලත්ව ඡන්ද මධ්‍යස්ථානක අනුගමනය කල යුතු ක්‍රියාමාර්ගයන් (2.9 කොටස) හා සමාන වේ.

- සියලුම නිලධාරීන් මැතිවරණ ශාලාවට ඇතුළු වීමට පෙර සම්පූර්ණ පුද්ගලික ආරක්ෂිත උපකරණ (ශල්‍ය මුඛ ආවරණ, අත් වැසුම්, මුහුණු ආවරණ, ශරීරය ආවරණය වන ඇඳුම් සහ බූට් සපත්තු) පැළඳිය යුතු අතර එය ඉවත් කළ යුත්තේ අදාල රාජකාරිය අවසන් වූ පසුව පමණි.
- නියෝජිතයින් මුඛ ආවරණ වලට අමතරව මුහුණු ආවරණ පැළඳිය යුතු අතර මීටරයක් වෙනුවට ඡන්දදායකයින් සමඟ මීටර් 2 ක දුරක් තබා ගත යුතුය.
- ඡන්ද විමසීම අවසානයේ ඡන්ද පෙට්ටියේ සියලුම පැති විෂබීජහරණය කර ඉන් පසුව මුද්‍රා තබා පොලිතින් බෑගයකට දැමිය යුතුය.

## 2.11ගණන් කිරීමේ මධ්‍යස්ථානවලදී ඡන්ද පෙට්ටි භාර ගැනීම

2.11.1 සෑම පුද්ගලයෙකුම අතර මීටරයක දුරස්ථ භාවයක් පවත්වා ගත හැකි වන පරිදි ස්ථානයක් තෝරාගෙන එලෙස සුදුසු පරිදි සකස් කල යුතුය. නිර්දේශිත සෞඛ්‍ය ක්‍රියාමාර්ග පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි වන පරිදි ඉඩකඩ සහිත ශාලාවක් කුලියට ගැනීම නිර්දේශ කරනු ලැබේ.

2.11.2 පුද්ගලයින් අතර දුරස්ථභාවය පවත්වා ගැනීම සඳහා ඕනෑම වේලාවක ස්ථානය තුල සිටින නිලධාරීන් සංඛ්‍යාව සීමා කරන්න.

2.11.3 ඡන්ද පෙට්ටි භාරදීමට බලා සිටින නිලධාරීන් හට මීටරයක දුරක් පවත්වා ගැනීමට හැකිවන පරිදි ඉඩකඩ වෙන් කල යුතුය.

2.11.4 මධ්‍යස්ථානයට පිවිසෙන ස්ථානයේදී අත් සේදීම / විෂබීජහරණය සඳහා පහසුකම් සැපයිය යුතු අතර පිවිසෙන සෑම පුද්ගලයෙකුම අත් සේදීම / දෑත් විෂබීජහරණය කිරීම කල යුතුය.

2.11.5 ඡන්ද පෙට්ටි භාර ගැනීමේ මධ්‍යස්ථානයට පිවිසීමට පෙර ඡන්ද පෙට්ටිවල පොලිතීන් ආවරණ ඉවත් කරන්න. මෙම පොලිතින් බැහැර කිරීම සඳහා වෙන්වූ කසල බඳුනක සැපයිය යුතුය.

## 2.12 ගණන් කිරීමේ මධ්‍යස්ථානයේදී පිළිපැදිය යුතු ආචාර විධි

2.12.1 කාර්ය මණ්ඩලයේ සහ ඇතුල්වන සියලු පුද්ගලයන් මුඛ ආවරණ පැළඳිය යුතුය.


2.12.2 සියලුම කාර්ය මණ්ඩලයේ සහ ශාලාවට ඇතුළු වන සෑම පුද්ගලයෙකුගේම ශරීර උෂ්ණත්වය පරීක්ෂා කල යුතු අතර 370C හෝ 98.40F ට වඩා වැඩි උෂ්ණත්වයක් ඇති ඕනෑම කෙනෙකුට ඇතුල් වීමට ඉඩ නොදිය යුතුය.

2.12.3 ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය සහ ගණන් කිරීමේ නියෝජිතයන් අතරද මීටරයක දුරක් පවත්වා ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩ ඇති ස්ථානයක් තෝරා ගෙන සුදුසු පරිදි සකස් කර ගත යුතුය.

2.12.14 පිටතට වාතය මුදාහරින විදුලි පංකා (Exhaust fans) ස්ථාපිත කිරීමෙන් ගණන් කිරීමේ මධ්‍යස්ථාය තුල වාතාශ්‍රය විධිමත් කල යුතුය.

2.12.15 දුරස්ථ භාවය පවත්වා ගැනීම සඳහා ගණන් කිරීමේ නිලධාරීන්ට මීටරයක් පිටුපසින් ගණන් කිරීමේ නියෝජිතයින්ගේ මේස සකස් කල යුතුයි.

Arrangement of the counting center




2.12.6 මධ්‍යස්ථානයට පිවිසෙන දොරටුවේදී දෑත් පිස දැමීමට ටිෂූ කඩදාසි සහ ඒවා ඉවතලීමට කසල බඳුන් (පොලිතීන් බෑගයක් යෙදූ) සහිතව අත් සේදීම/ විෂබීජහරණය කර දෑත් පිසදැමීම සඳහා පහසුකම් සැපයිය යුතුය.

2.12.7 සියලුම නිලධාරීන්, නියෝජිතයින්, ආරක්ෂක භටයන් හෝ පිවිසෙන වෙනත් ඕනෑම පුද්ගලයෙකු හට මුඛ ආවරණ ලබා දීම සහ ගණන් කිරීමේ මධ්‍යස්ථානයට පිවිසීමේදී ඔවුන් අත් සේදීම සහ මුඛ ආවරණ පැළඳ සිටීම පිළිබඳ සහතික විය යුතුයි.

2.12.8 සෑම ගණන් කිරීමේ නිලධාරියෙකුටම ප්‍රමාණවත්මුඛ ආවරණ සහ දෑත් සනීපාරක්ෂක බෝතලයක් ලබා දිය යුතුය. ඔවුන් හැකි සෑම විටම දෑත් පිරිසිදු කිරීම කල යුතුය.

2.12.9 මුඛ ආවරණ නොමැතිව සහ අත් සේදීමකින් තොරව ගණන් කිරීමේ මධ්‍යස්ථානයට පිවිසීමට කිසිවෙකුට ඉඩ නොදිය යුතුය.

2.12.10 ගණන් කිරීම සිදුවන අතරතුර ආහාර පාන පිළිගැන්වීම සිදු නොකල යුතුයි.

2.12.11 භෞතික දුරස්ථභාවය පවත්වා ගනිමින් විවෘත ස්ථානයක ආහාර පාන සැපයීම වඩාත් සුදුසුය.

2.12.12 වෙනත් මධ්‍යස්ථානවල නිලධාරීන් ඇතුළු අනවසර නිලධාරීන්ට කිසි විටෙක මධ්‍යස්ථානයට ඇතුළුවීමට ඉඩ නොදිය යුතුය.

2.12.13 ගණන් කිරීමේ රාජකාරි අවසන් වූ වහාම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් මධ්‍යස්ථානය විෂබීජහරණය කල යුතුය.

## 2.13 ප්‍රතිඵල නිකුත්කරන මධ්‍යස්ථානය

2.13.1 පරිශ්‍රයට ඇතුළු වන සෑම කෙනෙකුම සබන් යොදා අත් සේදීම හෝ දෑත් විෂබීජහරණය කල යුතුය.

2.13.2 සියලුම නිලධාරීන් සෑම විටම මුඛ ආවරණ පැළඳිය යුතුය.

2.13.3 සියලුම නිලධාරීන් සෑම විටම සෙසු නිලධාරීන් සමඟ මීටරයක දුරක් තබා ගත යුතුය.

## 2.14 කාර්ය මණ්ඩලය සහ උපකරණ ප්‍රවාහනය

කාර්ය මණ්ඩලය, ඡන්ද පෙට්ටි, අනෙකුත් පුද්ගලයින් සහ උපකරණ ප්‍රවාහනයේදී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කල යුතුය.

2.14.1 පුද්ගලයින් අතර රෝග සම්ප්‍රේෂණය වැළැක්වීම සඳහා ගමන් ඇරඹීමට පෙර වාහන පිරිසිදු කර විෂබීජහරණය කල යුතුය (ආසන, දොර අගුලු, ජනේල, ඇතුලත සහ පිටත දොර හැඬල ආදිය).

2.14.2 වාහනයට ඇතුළු වන දොරටුව අසල දෑත් පිරිසිදුකාරකයක් සවිකල යුතු අතර සෑම පුද්ගලයෙක්ම වාහනයට ඇතුල්වීමට පෙර දෑත් විෂබීජහරණය කර ගත යුතුයි.

2.14.3 ගමන් කරන අතරතුර සියලුම සේවකයින් මුඛ ආවරණ පැළඳිය යුතුය.

## 2.15 ආපනශාලා සහ ආහාර ගැනීමේ ස්ථාන

2.15.1 ආපනශාලාවේ/ආහාර ගන්නා ස්ථානයේ තදබදය වැළැක්වීම සඳහා කෑම විවේකය සහ තේ විවේකය කණ්ඩායම් වශයෙන් ලබා දිය යුතුය.

2.15.2 ආහාර ගැනීමේදී හැර අන් සියලු අවස්ථාවලදී ආපනශාලාව / ආහාර ගන්නා ස්ථානය තුලද මුඛ ආවරණ පැළඳ සිටින බවට සහතික විය යුතුය.

2.15.3 ආපනශාලාව/ආහාර ගන්නා ස්ථානය තුල පුද්ගලයින් අතර අවම දුර මීටරයක් පවත්වා ගත යුතු අතර ගෘහ භාණ්ඩ ස්ථානගත කිරීමේදී අවම දුර සැලකිල්ලට ගත යුතුය.

2.15.4 ආහාර ගන්නා අතර ආහාර, වීදුරු කොප්ප, පිඟන් සහ වෙනත් උපකරණ හුවමාරු කර ගැනීමෙන් වළකින්න.

2.15.5 බුෆේ ක්‍රමයට ආහාර ලබා දෙන අවස්ථා වලදී පුද්ගලයන් අතර රෝගය පැතිරීම වැලැක්වීම සඳහා ආහාර බෙදා දීමට කාර්ය මණ්ඩලයේ සේවකයෙක්/සේවකයන් ඒ වෙනුවෙන්ම යෙදවිය යුතුය.

## 3. පොලිස් නිලධාරීන් සඳහා විශේෂිත උපදෙස්

විවිධ මැතිවරණ කටයුතු සඳහා පොලිස් නිලධාරීන් පත් කරනු ලැබේ. එවැනි අවස්ථා වලදී පහත සඳහන් සෞඛ්‍ය ක්‍රියාමාර්ග අනිවාර්යෙන් අනුගමනය කල යුතුවේ.

3.1 පොලිස් නිලධාරීන් සෑම විටම මුඛ ආවරණ පැළඳිය යුතුය.

3.2 ඕනෑම මැතිවරණ රාජකාරී ස්ථානයකට (ඡන්ද මධ්‍යස්ථානය, ගණන් කිරීමේ මධ්‍යස්ථාන ආදිය) පිවිසීමට පෙර අත් සබන් යොදා සේදීම හෝ විෂබීජහරණය කල යුතුය.

3.3 එක් එක් නිලධාරියාට තනි තනිව දැත් විෂබීජහරණ ද්‍රාවන ලබා දී තිබිය යුතුය.

3.4 නිරෝධායන මධ්‍යස්ථානවල රාජකාරිවලට සහභාගී වන අයට සම්පූර්ණ ආරක්ෂිත උපකරණ ලබා දිය යුතුය.

3.5 එක් එක් නිලධාරීයා විසින් සෑම විටම ඔවුනොවුන් අතර මීටරයක දුර තබා ගත යුතුය.

3.6 යම් නිලධාරියෙකු විසින් වෙනත් ඕනෑම පුද්ගලයකු ස්පර්ශ කල විට (විරෝධතා ආදියේදී) තම දැත් සබන් සහ ජලය යොදා හොඳින් සේදිය යුතුය. එවැනි අවස්ථා කල්තියා දැනගත හොත් එවැනි රාජකාරිවලට යාමට පෙර මුහුණු ආවරණ පැළඳිය යුතුය.

## 4. විෂබීජහරණය

### 4.1 මතුපිට පෘෂ්ඨ විෂබීජහරණය සඳහා උපදෙස්

4.1.1. කාර්ය මණ්ඩලයේ සහ ඡන්ද දායකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා විවිධ පෘෂ්ඨයන් විෂබීජහරණය කිරීම අවශ්‍ය වේ.

4.1.2 එවැනි විෂබීජහරණ ක්‍රියාවලි සඳහා පහත සරල ක්‍රියා පටිපාටියක් අනුගමනය කල යුතු අතර එය මැතිවරණ කාර්ය මණ්ඩලය විසින් සිදු කල යුතුවේ.

4.1.3 සාමාන්‍ය පිරිසිදු කිරීමකින් හෝ දූවිලි පිස දැමීමකින් පසු,

- ලෝහ පෘෂ්ඨ 70% මද්‍යසාර අඩංගු ද්‍රාවණයකින් විෂබීජහරණය කල යුතුය.
- ලෝහ නොවන පෘෂ්ඨ 0.1% සෝඩියම් හයිපොක්ලෝරයිට් (Sodium Hypochlorite) යොදා විෂබීජහරණය කල යුතුය.

70% v/v මධ්‍යසාර ද්‍රාවණය සහ 0.1% සෝඩියම් හයිපොක්ලෝරයිට් ද්‍රාවණය සකස් කිරීමේ ක්‍රියා පටිපාටිය මෙම ලේඛනයට අමුණා ඇත.

**4.2 ගොඩනැගිලි පරිශ්‍ර විෂබීජහරණය සඳහා උපදෙස්**

4.2.1 සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ අධීක්ෂණය යටතේ මෙම මාර්ගෝපදේශයට අනුකූලව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, අනිකුත් කාර්ය මණ්ඩලය සමග මෙම ක්‍රියා පටිපාටිය සිදු කල යුතුවේ.

4.2.2 බිම අතු ගෑමෙන් පසු, සාමාන්‍ය පිරිසිදු කිරීමෙන් හෝ දූවිලි පිස දැමීමෙන් සහ ගොඩනැගිල්ලෙන් සියලුම පුද්ගලයින් ඉවත් කිරීමෙන් පසු,

- 0.1% සෝඩියම් හයිපොක්ලෝරයිට් ද්‍රාවණය ගොඩනැගිල්ලේ ඇතුළත හා පිටත සියලු බිත්තිවලට බිම් මට්ටමේ සිට අඩි 6 ක් දක්වා ඉසිය යුතුය.
- එම ද්‍රාවණය සියලුම ගෘහ භාණ්ඩ මතට ඉසිය යුතු ය.

# 5. කසල කළමනාකරණය

**5.1** මැතිවරණයට අදාල ඕනෑම ස්ථානයක අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පහත සඳහන් ක්‍රියා පටිපාටිය අනුගමනය කල යුතුය.

සියලුම දිරාපත් වන හා දිරාපත් නොවන අපද්‍රව්‍ය පොලිතීන් බෑගයක් දැමූ කසල බඳුන් තුලට එකතු කල පසු,

- නිවැරදි ලෙස බැහැරලීම සඳහා අදාල පළාත් පාලන ආයතනයට දැනුම් දීම හෝ
- ළඟම ඇති සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයේ ඇති දහනාගාරයට දැමීම හෝ
- 1% හයිපොක්ලෝරයිට් ද්‍රාවණය එයට ඉස එම භූමියේම වැළලීම සිදු කල යුතුය.

**5.2** මැතිවරණ පවත්වන ස්ථාන වල අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණය කිරීම අදාල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් සහතික කල යුතුය. මැතිවරණය සැසිවාරයෙන් පසු මධ්‍යස්ථානයේ විෂබීජහරණ කටයුතු සඳහා පැමිණෙන මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයා සහ කණ්ඩායම විසින් මෙය සිදු කල යුතුය.

# 6. මැතිවරණයෙන් පසු

සියලුම මැතිවරණ නිලධාරීන්, නියෝජිතයින් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා අදාල වේ.

**මැතිවරණ රාජකාරී වලින් පසු නිවසට පැමිණීමේදී අනුගමනය කල යුතු ක්‍රියා මාර්ග**

නිවසට ඇතුල් වීමට පෙර,

- සබන් යොදා හොඳින් අත් සෝදන්න.
- ඇඳුම් සහ සපත්තු / සෙරෙප්පු ඉවත් කර ඒවා නිවසින් පිටත තබන්න. ඒවා නිසිලෙස පිරිසිදු කිරීමෙන් පසු පමණක් නිවාස තුලට ගත යුතුය. පිරිසිදු කිරීමෙන් තොරව නැවත ඒවා භාවිතා නොකරන්න.
- ඔබ රැගෙන ගිය සියලු දේ නිවසින් පිටත තබන්න. කිසියම් භාණ්ඩයක් නිවස තුළට ගෙන යන්නේ නම් සබන් යොදා හෝ මධ්‍යසාර අඩංගු දියරයකින් විෂබීජහරණය කරන්න. (මෙය ඔබගේ ජංගම දුරකථනය, ඇස් කණ්ණාඩි, අත් ඔරලෝසු ආදිය සඳහා අදාළ වේ)
- නිවස තුල කිසිවක් ස්පර්ශ නොකර නාන කාමරයට ගොස් ස්නානය කරන්න.

# 7. සෞඛ්‍ය පරිපාලන ව්‍යුහය

මෙම මාර්ගෝපදේශය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා හඳුන්වා දෙන පරිපාලන ව්‍යුහය සහ වැඩ විස්තරය පහත වගුවේ දැක්වේ.

| අංකය | තනතුර | නිලධාරීන් සංඛ්‍යාව | රාජකාරීන් |
|---|---|---|---|
| 01 | ජාතික සම්බන්ධීකාරකවරුන් | 01 | • මැතිවරණයට අදාළ සියලු සෞඛ්‍ය ක්‍රියාමාර්ග ජාතික මට්ටමින් සම්බන්ධීකරණය කිරීම.<br>• සෞඛ්‍ය මාර්ගෝපදේශ සකස් කිරීම සහ මැතිවරණයේදී එය ක්‍රියාත්මක කිරීම සහතික කිරීම<br>• පුහුණු සැසි නිර්මාණය කිරීම හා සැලසුම් කිරීම.<br>• සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ද්‍රව්‍ය සකස් කිරීම.<br>• සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් පවරනු ලබන සෞඛ්‍යයට අදාල වෙනත් රාජකාරි. |
| 02 | සහයක සම්බන්ධීකාරකවරුන් | 02 | • ජාතික සම්බන්ධීකාරකවරයාට සිය රාජකාරි සඳහා සහාය වීම.<br>• මැතිවරණයට අදාළ සියලු සෞඛ්‍ය ක්‍රියාමාර්ග සෑම මට්ටමකින්ම ඵලදායි ලෙස ක්‍රියාත්මක වන බවට සහතික කිරීම.<br>• පුහුණු සැසි සංවිධානය කිරීම.<br>• සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ද්‍රව්‍ය සකස් කිරීම හා බෙදා හැරීම.<br>• සම්බන්ධීකාරක විසින් පවරනු ලබන වෙනත් මැතිවරණ සම්බන්ධ රාජකාරි<br>• මැතිවරණයට අදාළ සියළුම සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ද්‍රව්‍ය සහ අනෙකුත් ද්‍රව්‍ය සිංහල හා දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීම. |

| | | | |
|---|---|---|---|
| 03 | පළාත් සම්බන්ධීකාරකවරුන් (සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්) | 9 | • මැතිවරණ ආශ්‍රිත සෞඛ්‍ය ක්‍රියාමාර්ග පළාත් මට්ටමින් සම්බන්ධීකරණය කිරීම.<br>• ඔහුගේ / ඇයගේ පළාතේ මැතිවරණයට අදාළ සියලු සෞඛ්‍ය ක්‍රියාමාර්ග ඵලදායි ලෙස කරන බවට සහතික කිරීම.<br>• අදාල සියලුම කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව ලබා දීමට පියවර ගන්න<br>• අදාල මැතිවරණ සැකසුම් වලට සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ද්‍රව්‍ය බෙදා හැරීම.<br>• ජාතික සම්බන්ධීකාරක විසින් පවරනු ලබන වෙනත් මැතිවරණ සම්බන්ධ රාජකාරි. |
| 04 | දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් (සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන් සහ අධ්‍යක්ෂ, ජාතික සෞඛ්‍ය විද්‍යාතනය) | 26 | • මැතිවරණ ආශ්‍රිත සෞඛ්‍ය ක්‍රියාමාර්ග දිස්ත්‍රික් මට්ටමින් සම්බන්ධීකරණය කිරීම.<br>• ඔහුගේ / ඇයගේ දිස්ත්‍රික්කය තුළ මැතිවරණයට අදාළ සියලු සෞඛ්‍ය ක්‍රියාමාර්ග ඵලදායි ලෙස ක්‍රියාත්මක වන බවට සහතික කිරීම.<br>• අදාල සියලුම කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව ලබා දීමට පියවර ගන්න.<br>• අදාල මැතිවරණ සැකසුම් වලට සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ද්‍රව්‍ය බෙදා හැරීම.<br>• පළාත් සම්බන්ධීකාරක විසින් පවරනු ලබන වෙනත් මැතිවරණ සම්බන්ධ රාජකාරි |
| 05 | ප්‍රාදේශීය වසංගතරෝගවේදීන් | 26 | • මැතිවරණය ආශ්‍රිත සෞඛ්‍ය ක්‍රියාමාර්ග දිස්ත්‍රික් මට්ටමින් සම්බන්ධීකරණය කිරීම.<br>• ඔහුගේ / ඇයගේ දිස්ත්‍රික්කය තුළ මැතිවරණයට අදාළ සියලු සෞඛ්‍ය ක්‍රියාමාර්ග ඵලදායි ලෙස ක්‍රියාත්මක වන බවට සහතික කිරීම.<br>• අදාල සියලුම කාර්ය මණ්ඩලයට පුහුණු සැසි සංවිධානය කිරීම.<br>• අදාල මැතිවරණ සැකසුම් වලට සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ද්‍රව්‍ය බෙදා හැරීම.<br>• දිස්ත්‍රික් සම්බන්ධීකාරක විසින් පවරා ඇති වෙනත් මැතිවරණ සම්බන්ධ රාජකාරි. |
| 06 | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් | 350<br>350 | • සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය මගින් ප්‍රදේශයේ මැතිවරණයට අදාළ සියලුම සෞඛ්‍ය ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම<br>• සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයේ සියලුම මැතිවරණ සැකසුම් තුළ සෞඛ්‍ය මාර්ගෝපදේශ ඵලදායි ලෙස ක්‍රියාත්මක වන බවට සහතික කිරීම.<br>• ඔහු / ඇය යටතේ සිටින කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම..<br>• අදාල මැතිවරණ මධ්‍යස්ථාන වලට සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ද්‍රව්‍ය බෙදා හැරීම.<br>• දිස්ත්‍රික් සම්බන්ධීකාරක විසින් පවරනු ලබන වෙනත් මැතිවරණ සම්බන්ධ රාජකාරි. |

| | | | |
|---|---|---|---|
| 07 | කොළඹ මහා නගර සභාව | CMOH 1<br>MOH 6 | • සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයේ මැතිවරණයට අදාළ සියලුම සෞඛ්‍ය ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය හා අධීක්ෂණය.<br>• සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයේ සියලුම මැතිවරණ සැකසුම් තුළ සෞඛ්‍ය මාර්ගෝපදේශ ඵලදායි ලෙස ක්‍රියාත්මක වන බවට සහතික කිරීම.<br>• ඔහු / ඇය යටතේ සිටින කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම.<br>• අදාල මැතිවරණ මධ්‍යස්ථාන වලට සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ද්‍රව්‍ය බෙදා හැරීම .<br>• ජාතික සම්බන්ධීකාරක විසින් පවරනු ලබන වෙනත් මැතිවරණ සම්බන්ධ රාජකාරි |
| | | PHI 42<br>PHM 60<br>PHNS12 | • පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම.<br>• ඔහු / ඇය යටතේ සිටින කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම.<br>• සියළුම සෞඛ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා මැතිවරණ දිනයට පෙර සියලුම ඡන්ද මධ්‍යාස්ථාන අධීක්ෂණය කිරීම.<br>• ඡන්ද මධ්‍යස්ථාන තුළ සෞඛ්‍ය මාර්ගෝපදේශ ඵලදායි ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා මැතිවරණ දිනය පුරා ප්‍රදේශයේ ඡන්ද මධ්‍යස්ථාන වෙත ගොස් අධීක්ෂණය කිරීම.<br>• මැතිවරණ මාර්ගෝපදේශ අනුව නියම කර ඇති පරිදි විෂබීජහරණ ක්‍රියාකාරකම් සිදු කිරීම /සංවිධානය කිරීම<br>• සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මහතා/ මහත්මිය විසින් පවරා ඇති වෙනත් මැතිවරණ සම්බන්ධ රාජකාරි |
| 08 | මහනුවර මහා නගර සභාව | CMOH 1<br>MOH 01 | • සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයේ මැතිවරණයට අදාළ සියලුම සෞඛ්‍ය ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය හා අධීක්ෂණය.<br>• සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයේ සියලුම මැතිවරණ සැකසුම් තුළ සෞඛ්‍ය මාර්ගෝපදේශ ඵලදායි ලෙස ක්‍රියාත්මක වන බවට සහතික කිරීම.<br>• ඔහු / ඇය යටතේ සිටින කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම.<br>• පුහුණු සැසි සංවිධානය කිරීම.<br>• පුහුණු සැසි සංවිධානය කිරීම.<br>• මැතිවරණ කටයුතු පවත්වන ස්ථාන වලට සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ද්‍රව්‍ය බෙදා හැරීම.<br>• ජාතික සම්බන්ධීකාරක විසින් පවරනු ලබන වෙනත් මැතිවරණ සම්බන්ධ රාජකාරි |
| | | PHI 10<br>PHM 17<br>PHNS 2 | • පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම.<br>• සෞඛ්‍ය ප්‍රවර්දනය සඳහා ද්‍රව්‍ය බෙදා හැරීමේදී එම ද්‍රව්‍ය නියමිත වේලාවට සුදුසු ස්ථානවල බෙදා හැර ඇති බවට / අලවා ඇති බවට සහතික වන්න.<br>• සියළුම සෞඛ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා මැතිවරණ දිනයට පෙර සියලුම මධ්‍යස්ථාන |

<table>
<tr><td></td><td></td><td></td><td>අධීක්ෂණය කිරීම.<br>• ඡන්ද මධ්‍යස්ථාන තුළ සෞඛ්‍ය මාර්ගෝපදේශ ඵලදායි ලෙස ක්‍රියාත්මක වන බවට සහතික කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා මැතිවරණ දිනය පුරා ප්‍රදේශයේ ඡන්ද මධ්‍යස්ථාන වෙත ගොස් අධීක්ෂණය කිරීම.<br>• මැතිවරණ මාර්ගෝපදේශ අනුව නියම කර ඇති පරිදි විෂබීජහරණ ක්‍රියාකාරකම් සිදු කිරීම / සංවිධානය කිරීම.<br>• සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මහත්මයා/ මහත්මිය විසින් පවරා ඇති වෙනත් මැතිවරණ සම්බන්ධ රාජකාරි</td></tr>
<tr><td>09</td><td>පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්</td><td>350</td><td rowspan="5">• පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම.<br>• සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ද්‍රව්‍ය නියමිත වේලාවට සුදුසු ස්ථානවල බෙදා හැර ඇති බවට/ අලවා ඇති බවට සහතික වන්න.<br>• සියළුම සෞඛ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා මැතිවරණ දිනයට පෙර සියලුම ඡන්ද මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීම.<br>• සහ සියළුම ඡන්ද මධ්‍යස්ථාන වල සෞඛ්‍ය මාර්ගෝපදේශ ඵලදායි ලෙස ක්‍රියාත්මක වන බවට සහතික කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා මැතිවරණ දිනය පුරා ප්‍රදේශයේ ඡන්ද මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීම.<br>• මැතිවරණ මාර්ගෝපදේශ අනුව නියම කර ඇති පරිදි විෂබීජ නාශක ක්‍රියාකාරකම් සිදු කිරීම / සංවිධානය කිරීම.<br>• සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මහතා/ මහත්මිය විසින් පවරා ඇති වෙනත් මැතිවරණ සම්බන්ධ රාජකාරි</td></tr>
<tr><td>10</td><td>මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්</td><td>1600</td></tr>
<tr><td>11</td><td>පරිපාලන මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන්</td><td>700</td></tr>
<tr><td>12</td><td>පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්</td><td>700</td></tr>
<tr><td>13</td><td>පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්</td><td>5800</td></tr>
<tr><td></td><td>මුළු එකතුව</td><td>10066</td><td></td></tr>
</table>

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

## ඇමුණුම 01

**මධ්‍යසාර අඩංගු දැත් පිරිසිදුකාරකයක් පිළියෙළ කර ගන්නා අයුරු**

අවශ්‍ය අමුද්‍රව්‍ය

1. ඊතයිල් මධ්‍යසාර (සාන්ද්‍රණය 90% වැඩි) හෝ අයිසොප්‍රොපිල් මධ්‍යසාර (සාන්ද්‍රණය 90% වැඩි)
2. සාන්ද්‍රණය 3% වන හයිඩ්‍රජන් පෙරොක්සයිඩ්
3. සාන්ද්‍රණය 98% ග්ලිසරෝල්
4. ආහාර වර්ණ ගැන්වීම (නිල් හෝ කොළ)
5. ජලය

සකස් කිරීමේ ක්‍රමය

දැත් පිරිසිදුකාරකයක් ද්‍රවණ මිලි ලීටර් 100ක් සකස් කිරීම සඳහා,

1. ඊතයිල් මධ්‍යසාර හෝ අයිසොප්‍රොපිල් මධ්‍යසාර මිලිලීටර් 85,
2. හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් මිලි ලීටර් 4,
3. ආහාර වර්ණක බින්දු කිහිපයක් සහ
4. ග්ලිසරෝල් මිලි ලීටර් 1.5 ක් අවශ්‍ය වේ.

ඉහත සඳහන් වන එක් මධ්‍යසාර වර්ගයක් ප්‍රමාණවත් ධාරිතාවක් සහිත බෝතලයකට (මිලි ලීටර් 150ක් හෝ ඊට වැඩි ධාරිතාව ඇති) එක් කරන්න. ඉන්පසු බෝතලයට හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් එක් කරන්න. එය මිශ්‍ර කිරීමෙන් පසුව, ග්ලිසරෝල් එම මිශ්‍රණයට එක් කරන්න. ඉන්පසු මිශ්‍රණයේ සම්පූර්ණ පරිමාව මිලි ලීටර් 100 ක් වන තෙක් එයට ජලය එක් කරන්න. අවසාන වශයෙන්, බෝතලය වසා හොඳින් මිශ්‍ර කල යුතුය. මෙලෙස සෑදූ දියරය, මධ්‍යසාර අඩංගු දැත් පිරිසිදුකාරකයක් ලෙස භාවිතා කල හැකිය.

**<u>0.1% සෝඩියම් හයිපොක්ලෝරයිට් ද්‍රවණය පිළියෙළ කර ගන්නා අයුරු</u>**

| අඩංගු ද්‍රව්‍ය | එකතු කල යුතු ජලය ප්‍රමාණය | අවසාන ද්‍රවණය |
|---|---|---|
| 1% සෝඩියම් හයිපොක්ලෝරයිට් ද්‍රවණයෙන්ම මිලි ලීටර් 100 ක් | **මිලි ලීටර් 900** | 0.1% සෝඩියම් හයිපොක්ලෝරයිට් ද්‍රවණය |
| 0.5% සෝඩියම් හයිපොක්ලෝරයිට් ද්‍රවණයෙන් මිලි ලීටර් 200 ක් | **මිලි ලීටර් 800** | |